කවරෙකු අල්ලාහ් හමුවීමට ප්රිය කරන්නේ ද අල්ලාහ් ද ඔහු හමුවීමට ප්රිය කරයි. කවරෙකු අල්ලාහ් හමුවීමට පිළිකුල් කරන්නේ ද අල්ලාහ් ද ඔහුව හමුවීමට පිළිකුල් කරයි.

ආඉෂා -රළියල්ලාහු අන්හා- තුමිය විසින් වාර්තා කරන ලදී. මෙය මර්ෆූඃ ගණයට අයත් හදීසයකි. “කවරෙකු අල්ලාහ් හමුවීමට ප්රිය කරන්නේ ද අල්ලාහ් ද ඔහු හමුවීමට ප්රිය කරයි. කවරෙකු අල්ලාහ් හමුවීමට පිළිකුල් කරන්නේ ද අල්ලාහ් ද ඔහුව හමුවීමට පිළිකුල් කරයි.“ එවිට මම, “අල්ලාහ්ගේ දූතයාණනි, එය මරණය පිළිකුල් කිරීම ද? එසේ නම් අපි සියලු දෙනා මරණය පිළිකුල් කරන්නෙමු ද යැයි පැවසුවෙමි. එවිට එතුමා, “එය එසේ නොවේ. නමුත් දෙවියන් කෙරෙහි විශ්වාසය තැබූ අයකු අල්ලාහ්ගේ කරුණාව, ඔහුගේ තෘප්තිය, ඔහුගේ ස්වර්ගය
පිළිබඳ සුභාරංචි දන්වනු ලැබූ විට අල්ලාහ්ව හමුවීමට ඔහු ප්රිය කරනු ඇත. එවිට අල්ලාහ්
ද ඔහුව හමුවීමට ප්රිය කරයි. දෙවියන් ප්රතික්ෂේප කරන අයකුට අල්ලාහ්ගේ දඬුවම ඔහුගේ කෝපය ගැන දන්වනු ලැබූ විට ඔහු අල්ලාහ්ව හමුවීම පිළිකුල් කරයි. අල්ලාහ් ද ඔහු
හමුවීමට පිළිකුල් කරයි.“ යනුවෙන් පැවසුහ.
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත]

නියත වශයෙන්ම නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්-තුමා “කවරෙකු අල්ලාහ් හමුවීමට ප්රිය කරන්නේ ද අල්ලාහ් ද ඔහු හමුවීමට ප්රිය කරයි. කවරෙකු අල්ලාහ් හමුවීමට පිළිකුල් කරන්නේ ද අල්ලාහ් ද ඔහුව හමුවීමට පිළිකුල් කරයි.“ යනුවෙන් පැවසූහ. එවිට ආඉෂා -රළියල්ලාහු අන්හා- තුමිය, “අල්ලාහ්ගේ දූතයාණනි, එය මරණය පිළිකුල් කිරීම ද? එසේ නම් අපි සියලු දෙනා මරණය පිළිකුල් කරන්නෙමු“ යැයි පවසා සිටියාය. එවිට එතුමා, “එය එසේ නොවේ.“ යැයි පවසා තවදුරටත් “සැබැවින්ම මිනිසා අල්ලාහ් හමුවීමට ප්රිය කරන විට අල්ලාහ් ද ඔහු හමුවීමට ප්රිය කරයි. එනම්, සැබැවින්ම දෙවියන් කෙරෙහි විශ්වාසය තැබූ අයකු වනාහි, ඔහු ස්වර්ගයේ සූදානම් කර ඇති කුසල් ත්යාගය, උසස් පිරිනැමීම් පිළිබඳ විශ්වාස කොට ඒවා ප්රිය කරන විට මෙලොව අල්ප යැයි සලකා එයට වැදගත්කමක් නොදී තමන් ඊටත් වඩා යහපත් තැනකට යන්නට සිටින බව හඳුනා ගෙන කටයුතු කරන විට, ඔහු අල්ලාහ් හමුවීමට ප්රිය කරනු ඇත. විශේෂයෙන් එය මරණ අවස්ථාවය. අල්ලාහ්ගේ තෘප්තිය හා කරුණාව පිළිබඳ ශුභාරංචි දන්වා සිටින අවස්ථාවේ අල්ලාහ් හමු වීමටත් ඔහු වෙත යෑමටත් ප්රිය කරයි. එවිට අල්ලාහ් ද ඔහු හමුවීමට ප්රිය කරනු ඇත. නමුත් දේව ප්රතික්ෂේපකයකු වූ කලී, අල්ලාහ් අප ආරක්ෂා කරත්වා! සැබැවින්ම ඔහු අල්ලාහ්ගේ දඬුවම හා ඔහුගේ කෝපය ගැන දන්වා සිටිනු ලබන අවස්ථාවේ අල්ලාහ් මුණ ගැසීමට පිළිකුල් කරයි. එවිට අල්ලාහ් ද ඔහුව මුණ ගැසීමට පිළිකුල් කරනු ඇත.“ තවත් හදීසයක මෙසේ වාර්තා වී ඇත. සැබැවින්ම දේව ප්රතික්ෂෙකයාගේ ආත්මය වනාහි, තමන් කෙරෙහි ඇති කෝපය හා ක්රෝධය ගැන දන්වා සිටිනු ලැබ තම ආත්මය ශරීරයෙන් ඉවත් වන විට එය බැහැර වීමට ප්රතික්ෂේප කරයි. එහෙයින් දේව ප්රතික්ෂේපකයාගේ ප්රාණය ඉවත් වන විට තෙත් පනාවකින් රෝම ඉවත් කරන්නාක් මෙන් පවතියි. එනම් තම ආත්මය ශරීරයෙන් පිටවීමට ඔහු පිළිකුල් කරයි. හේතුව ඔහුට නපුරු දෑ ගැන ශුභාරංචි දන්වා ඇති බැවිනි. අල්ලාහ් අප ආරක්ෂා කරත්වා! උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා සිටියි. “අපරාධකරුවන් මරණ වේදනාවේ සිටිනු ඔබ දුටුවේ නම්, මලක්වරු තම අත් විහිදුවාලමින් නුඹලාගේ ප්රාණ නුඹලාම ඉවත් කරනු යැයි පවසති.“ මෙය ඔවුන්ගේ ප්රාණවල අභාග්යයයි. අල්ලාහ් අප ආරක්ෂා කරත්වා! තම ප්රාණය ඉවත් කිරීම ඔවුහු ප්රිය නොකරති. නමුත් මලක්වරු නුඹලාගේ ප්රාණයන් නුඹලා ඉවත් කරනු යැයි පවසා සිටිති.එවිට ශුභාරංචි දන්වා සිටින විට ශරීරයෙන්

වෙන්ව පවතී. මලක්වරුන් තෙත් රෝම පනාවකින් ඉවත් කරන්නාක් මෙන් එය ඉවතට එන තෙක් ගලවා ගනිති. අල්ලාහ් අප ආරක්ෂා කරත්වා!

http://sunnah.global/hadeeth/si/show/8266